**පොතුවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් සහ වාහන 29 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් සහ වාහනාවල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වේ. | සභාව සතු ඉඩම් සහ වාහනවල වටිනාකම තක්සේරු කිරීමට නිලධාරීන් නොමැතිවීමෙන් තක්සේරු කිරීමේ අපහසුතාවයක් ඇත.ඉදිරියේදි මෙය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ii) | ගබඩා භාණ්ඩවල වටිනාකම රු.197,890 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ලේඛනයේ ගබඩා භාණ්ඩවල අවසන් තොගයේ වටිනාකම නිවැරදි කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශය අනුව ගබඩා භාණ්ඩවල වටිනාකම වැරදීමකින් 2019 අවසන් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි. මෙවැනි වැරදි ඉදිරියේදි සිදු නොවීමට වග බලා ගන්නෙමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂයට අදාල අනෙකුත් ආදායම්වල හිභය, හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.සා.-7) අනුව රු.18,571,249 ක් වුවද, | අදාල නොසැසදීම් සඳහා ගැලපීම් කළ යුතු වේ. | ආදායම් අයවීම් සහ හිඟ ප්‍රකාශයේ ස්ථාවර තැන්පත් පොලි රු.1,977,009 ක් අතුළත් වී නොතිබුණි. 2020 අවසන් ගිණුම්වල මෙම වැරදි නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් වියදම් ගිණුම් අනුව රු.20,548,258 ක් බැගින් රු.1,977,009 ක වෙනසක් විය. | | |
| (ii) | මූල්‍ය ප්‍රකාශන අනුව අත්තිකාරම් ගෙවීම්වල ශේෂය රු.2,120,203 ක් වුවද, ලේඛන අනුව රු.2,051,075 ක් පිළබඳව රු.69,128 ක වෙනසක් විය. | ලේඛනයේ අත්තිකාරම් ගෙවීම් ශේෂය නිවැරදි කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන අනුව අත්තිකාරම් ගෙවීම්වල ශේෂය 2019 අවසන් ගිණුම්වල වැරදීමකින් වැඩියෙන් දක්වා තිබුණි. මෙවැනි වැරදි ඉදිරියේදි සිදු නොවීමට වග බලා ගන්නෙමි. |

**(ඇ)** **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.4,765,574 ක් වටිනා ගිණුම් විෂයන් 6 ක් සඳහා ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ වාර්තා හා පුස්තකාල පරිග්‍රිහක ලේඛනය ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය/ සන්නිරීක්ෂණය කිරීමට හොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතුවලට සම්බන්ධ නිලධාරින් තුන් දෙනෙකුගෙන් ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | අදාල රීති අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) 59 රීතිය | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය අනුව එක් එක් වර්ෂය | අදාල රීති අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ආරම්භයේ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු.2,501,356 ක් වටිනා තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් සභාව විසින් කඩිනමින් ක්‍රියාකරනු ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,020,588 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,920,147 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 4,505 | - | - | - | 2,005 | - | - | - |
| කුලී | 9,780 | 9,413 | 8,298 | 4,808 | 8,420 | 9,143 | 7,965 | 3,693 |
| බලපත්‍ර ගාස්තු | 4,235 | 3,480 | 3,480 | - | 3,380 | 3,234 | 3,234 | - |
| වෙනත් ආදායම් | 24,500 | 31,371 | 37,987 | 4,036 | 28,000 | 27,135 | 24,634 | 10,652 |
| | **43,020** | **44,264** | **49,765** | **8,844** | **41,805** | **39,512** | **35,833** | **14,345** |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හා භෝජන ශාලා 146 ක ඉපැයූ ආදායමෙන් සියයට 1 දක්වා බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පනත අනුව බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම බදු අයකිරීම සඳහා පහත සඳහන් කරුණු තක්සේරු කිරීම නොහැකිව ඇත.<br>- හොටල්වල වාර්ෂිකව ආදායම්<br>- උපයාගත් ලාභය<br>- හෝටල් ඉඩම්වල වාර්ෂික වටිනාකම<br>මේ සම්බන්ධයෙන් පුහුණු නිලධාරීන් අප සභාවේ නොමැත. සභාවේ ආදායම් පරීක්ෂක පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය කටයුතු කරමි. |

**2.2.3 කුලි**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1992 සිට 2018 දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු හිඟ බදුකුලි රු.2,778,929 ක් මුදලක් අයනොවී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙය නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කරමි. |
| (ආ) | 2016 වර්ෂය සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාවූ කාල පරිච්ඡේදයට අයත් පොදු වෙළඳ පොළ කඩ කාමර හිඟ බදු මුදල් රු.793,486 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකුලි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ අයකිරීම් සම්බන්ධයෙන් නව කඩකාමර බදු දීමේදි හිඟ බදු මුදල් ආපහු ගෙවීමෙන් පසු කඩ කාමර බදු දෙනු ලැබේ. තවද, සමහර හිඟ මුදල් මෙම වර්ෂයේ අයවී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම ඇතුළු ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය අතුරු ව්‍යවස්ථා අනුව කර්තව්‍ය ඉටු කිරීම සඳහා 2014 පෙබරවාරි 14 දිනැති 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- |
| (i) | තිරසාර සංවර්ධනය මැනීමට දර්ශක ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | දර්ශක ඇති කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | 2017, 2018 සහ සමාලෝචිත වර්ෂයට තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන හඳුනා ගෙන නොතිබුණි. | මුදල් ප්‍රතිපාදන හඳුනාගෙන මුදල් ප්‍රතිපාදන කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ක්‍රියාත්මක තත්වයේ නොමැති වාහන 10 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | පාවිච්චියට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ භාණ්ඩ විකිණීම් සහ විනාශ කිරීම් සම්බන්ධයෙන් කමිටුවක් පත්කර අනුමැතිය සඳහා යවා ඇත. අනුමැතිය ලද පසු අවශ්‍ය කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලේකම්, කළමනාකරණ සහායක, ක්ෂේත්‍ර අධීක්ෂක, රියදුරු 03 දෙනෙකු සහ මුරකරු යන තනතුරු 07 ක පුරප්පාඩු පැවතුනි. | පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් උසස් නිලධාරින් වෙත මාසික කාර්ය මණ්ඩල විස්තර වාර්තාවේ පෙන්වා ඇත. එම පුරප්පාඩු පිරවීමේ බලය ඔවුන් සතුව ඇත. |
| (ආ) | 2018 සහ 2019 වර්ෂවල සේවකයන්ගෙන් වැඩිපුර අයකර ඇති පිළිවෙලින් රු.55,765 ක් සහ රු.100,420 ක් ආපසු ගෙවා නොතිබුණි. | වැඩිපුර අයකරගත් මුදල් අදාල නිලධාරින්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වේ. | වැඩිපුර අයකර ගත් මුදල හඳුනාගෙන අදාල නිලධාරින්ට නැවත ගෙවීමට කඩිනමින් ක්‍රියා කරමි. |
| (ඇ) | සේවකයන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ සේවක ණය රු.559,552 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයනොවී තිබුණි. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ණය සම්බන්ධ නිලධාරීන් දැනට සේවයේ නොමැතිවීමෙන් ණය ශේෂය සමථ මණ්ඩලය මගින් අයකර ගැනීමට කටයුතු කරන්නෙමි. |
| (ඈ) | එක් නිලධාරියෙකුට ගෙවීම සඳහා 2009 වර්ෂයේදී ලබා ගන්නා ලද විශ්‍රාම පාරිතෝෂික මුදල රු. 103,747 ක් එම නිලධාරියාට ගෙවා නිරවුල් කර නොතිබුණි. | අදාල ලියවිලි ලබා ගෙන සුදුසු කටයුතු කළ යුතු වේ. | මෙම ගෙවීමට අදාල ලියවිලි පරීක්ෂාකර බලා අවශ්‍ය කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 අයිතිය පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙනත් ආයතවලින් පරිත්‍යාග වශයේ ලැබුණු වාහන 12 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ වාහන සභාවේ නමට මාරු කිරීම සඳහා කටයුතු යළ යුතු වේ. | UNOPS ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන සභාවේ නමට අයිතිය පවරා ගැනීම සඳහා 2019 වර්ෂයේ කටයුතු කළ නමුත්, අදාල ආයතනවලින් ලබා දෙන ලද වාහනවල වටිනාකම අධික නිසා අයිතිය පවරා ගැනීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු ඉඩම් 46 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් විසින් අදාල නිලධාරියා වෙත අයිතිය පවරා දීමේ කටයුතු කඩිනම් කරන ලෙස නියෝග කර ඇත. තවද, දේපළ කීපයක් මැණීම සඳහා දිස්ත්‍රික් මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී කටයුතු කරමි. |

**3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටර් 06 ක්, ට්‍රේලර් වතුර ටැංකි 02 ක්, යතුරුපැදි 02 ක්, ට්‍රේලර් 02 ක් සහ කැබ් රථයක් වර්ෂ 05 කට වැඩි කාලයක ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට 2019 වර්ෂයට අදාල භාණ්ඩ විකිණීම් සහ විනාශ කිරීම සඳහා කමිටුවක් පත්කර අනුමැතිය සඳහා යවා ඇත. අනුමැතිය ලද විගස ක්‍රියාත්මක කරමි. |

**3.4.3 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභවේ ආදායම වැඩිකර ගැනීම සහ රැකියා අවස්ථා ඇතිකර ගැනීමේ අරමුණෙන් 2008 වර්ෂයේදී වර්ල්ඩ් විෂන් ආයතනයෙන් රු.1,231,600 ක අරමුදල සහ 2011 වර්ෂයේ සභා අරමුදලින් රු.1,612,127 ක් යොදා ගනිමින් කඩදාසි ප්‍රතිචක්‍රීය කරන මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද, එය ප්‍රයෝජනයට නොගැනීම නිසා විනාශ වෙමින් පැවතුනි. | අදාල වත්කම් අදාල කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීම මධ්‍යස්ථානය ක්‍රියාකිරීම සඳහා සේවකයන්ට පුහුණුවක් ලබා දිය යුතුවේ. තවද, මේ මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලි බලය මෙම මාර්ගයේ නැත. තවද, සවිකරන ලද උපකරණ ප්‍රයෝජනයට ගත නොහැකිව දිරාපත්වී ඇත. මේවා විකුණා දැමීමට කඩිනමින් කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු වේ. | අදාල චක්‍රලේඛ පරික්ෂා කර ඒ අනුව ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කිරීමට සභාව විසින් කටයුතු කරනු ලැබේ. |

**4** **ගිණුම් ගතයුතුභාවය සහ යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පැවත්වීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |